(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(6).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 සැප්තැම්බර් 22 අඟහරුවාදා**

**2020 ඔක්තෝබර් 06 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

128/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරමට අයත් තාල්වුපාඩු ප්‍රදේශයේ පිහිටා තිබූ සංස්කෘතික මධ්‍යස්ථානය, යුද්ධය පැවති කාලවකවානුවේදී මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ භාවිතය සඳහා යොදවාගෙන තිබී, හානියට පත්වීම හේතුවෙන්, 2018 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මෙලෙස හානියට පත්වූ සංස්කෘතික මධ්‍යස්ථානය වෙනුවට නව සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 25ක මුදලක් වෙන් කළ බවත්;

(ii) මෙම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා එවක සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සෘජුවම එම ප්‍රදේශයට ගොස් ඒ සඳහා අවශ්‍ය භූමි භාගය හඳුනාගෙන එවක සංස්කෘතික අමාත්‍යාංශයට එකී ඉඩමේ බලපත්‍රය පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම නව සංස්කෘතික මධ්‍යස්ථානයේ වැඩකටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

184/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ දූපත් කලාපයේ, එළුවයිතීවු නමැති දූපතක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දූපතේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එළුවයිතීවු හා ඌර්කාවට්තුරෙ අතර මුහුදු දුර ප්‍රමාණය නාවික සැතපුම් වලින්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එළුවයිතීවු නමැති ඉපැරණි දූපතේ පිහිටි සරවණබවා විද්‍යාලේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයට අවසන් වරට සිසුන් පෙනී සිටි වර්ෂය;

(ii) එම පාසලේ සිසුන් මේ වනවිට ඉහත විභාගයට පෙනී සිටින ස්ථානය;

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය එළඹෙයිතිවුහිදී පැවැත්වීමට ඇති බාධාව;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

251/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ කටු පොල් (Palm oil) වගාවේ යෙදෙන සමාගම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් සමාගම විසින් කටු පොල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කටු පොල් වගාකිරීමට එම වතු සමාගම්වලට බලපත්‍ර තිබේද;

(ii) දැනට වගා කර ඇති කටු පොල් වගාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

346/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019.11.16 දින සිට මේ දක්වා හිටපු අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතාට රජයෙන් ආරක්ෂාව ලබා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ලබාගෙන තිබෙන අනුමතිය කවරේද;

(iii) ඒ සඳහා අනුයුක්ත කර සිටින ඇමති ආරක්ෂක ඒකකයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා රජයෙන් ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(v) එවැනි ආරක්ෂාවක් හිටපු අග්‍රාමාත්‍යවරුන් සඳහා ද ලබා දී තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

59/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බඳවා ගනු ලැබූ —

(i) ස්ථිර;

(ii) අනියම්;

(iii) ආදේශක;

සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ බඳවා ගනු ලැබූ සේවකයන්ගේ නම් හා බඳවා ගනු ලැබූ තනතුරු කවරේද;

(ii) එම එක් එක් තනතුර සඳහා අනුමත වැටුප් හා දීමනා කවරේද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට —

(i) සේවකයන් බඳවා ගැනීමේ;

(ii) වැටුප් හා දීමනා ගෙවීමේ;

පටිපාටිය විධිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

101/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු විශාල ප්‍රමාණයක් ඇති බවත්;

(ii) එම කුඹුරුයායන්හි ජල වහනය දුර්වලවීම හා ජලයේ රසායනික සංයුතිය වෙනස්වීම මෙයට හේතුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු ප්‍රමාණය පිළිබඳ සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iii) මෙම කුඹුරු ඉඩම්, ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගැනීමට රජය සැලසුම් කර තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

162/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි ජල හා මලාපවහන පහසුකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නිවාස ඒකක සඳහා ඉහත පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එසේනම්, එම වැඩපිළිවෙළ කවර ආකාරයේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

213/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ යකඩ සහ වානේ ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම යකඩ සහ වානේ ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම යකඩ සහ වානේ ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට යකඩ සහ වානේ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 07 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

111/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අඩු ආදායම්ලාභී පවුල්වල 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන පාසල් සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2019 වර්ෂයේදී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව ශිෂ්‍යාධාර ලබන පාසල් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ශිෂ්‍යාධාර ලබා දීම සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද;

(iii) එම මුදලින් නිසියාකාරව ශිෂ්‍යාධාර මුදල් ලබා දී තිබේද;

(iv) 2020 වර්ෂය සඳහා ශිෂ්‍යාධාර වෙනුවෙන් කොපමණ මුදලක් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශිෂ්‍යාධාරලාභීන්ට නිසි කලට වේලාවට ශිෂ්‍යාධාර ලබා දී නොමැති බවට ඇති චෝදනා එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

129/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පල්ලිමුනෙ ග්‍රාමයේ පිහිටි ක්‍රීඩා පිටියේ ප්‍රතිසංස්කරණ කටයුතු, එවක මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද නමුත්, පසුගිය අවුරුදු පහකට අධික කාලය තුළ එය අවසන් කර නොමැති බවත්;

(ii) එම ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කළ කොන්ත්‍රාත්කරුගේ ජල හා විදුලි සම්බන්ධතා වෙනුවෙන් වූ අධික හිඟ මුදල් ප්‍රමාණය හේතුවෙන් එම සම්බන්ධතාවයන් විසන්ධි කර ඇති බවත්;

(iii) එම ක්‍රීඩා පිටියේ ඉතිරි වැඩකටයුතු අවුරුද්දක් තුළ ආරම්භ කරන බවට නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් කිහිපවරක්ම තමන්ට පොරොන්දු වූ නමුත්, මේ වනතුරු එම ඉතිරි වැඩකටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පල්ලිමුනෙ ක්‍රීඩා පිටියේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

252/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හන්තාන වතුයාය මහනුවර දිස්ත්‍රික්කයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 08 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

186/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ, පූනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිළි/ මුලංගාවිල් මහා විද්‍යාලය නමැති පාසලක් පවතින බවත්;

(ii) කිළිනොච්චියේ ඇති ජාතික පාසල් දෙකෙන් එකක් වූ ඉහත විද්‍යාලයෙහි පහළ අධ්‍යාපන තත්ත්වයක්, ගුරු/සේවක පුරප්පාඩු, ගෘහභාණ්ඩ/ගොඩනැගිලි සහ සම්පත් හිඟකම් ඇතුළු අඩුපාඩු රාශියක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම පාසලට අවශ්‍ය ගොඩනැගිලි සහ ගෘහභාණ්ඩ ලබා දෙන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත විද්‍යාලයෙහි විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය එක් එක් තනතුරු පිළිබඳ විස්තර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත විද්‍යාලයෙහි සුළු සේවක පුරප්පාඩු 17ක් පැවතියද, මේ දක්වා එකී පුරප්පාඩු පිරවීම සඳහා පියවර නොගැනීමට හේතුව කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) උක්ත පුරප්පාඩු පිරවීමකින් තොරව සිසුන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කළ නොහැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

253/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බෝහිල් වත්ත, මහනුවර දිස්ත්‍රික්කයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

418/2020

ගරු වරුණ ලියනගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණිවැලි දුම්රිය මාර්ග රක්ෂිතයේ අවිස්සාවේල්ල සිට ඕපනායක දක්වා වූ කොටසේ පසුගිය දශක 5කට ආසන්න කාලයක් තිස්සේ පදිංචි වී සිටින පදිංචිකරුවන්හට බදු ඔප්පු හෝ වෙනත් නීතිමය හිමිකම්පතක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) බදු ඔප්පු හෝ වෙනත් නීතිමය හිමිකම්පතක් හිමි නොවූ අනෙකුත් පදිංචිකරුවන් සහ ව්‍යාපාර ස්ථාන හිමිකරුවන් සඳහා ද බදු ඔප්පු ලබා දීමේ හැකියාවක් පවතීද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, එකී පදිංචිකරුවන් /ව්‍යාපාර ස්ථාන හිමිකරුවන් —

(i) සිය දරුවන් පාසලවලට ඇතුළත් කිරීමේදී;

(ii) සිය ව්‍යාපාර සඳහා ණය ලබා ගැනීමේදී;

(iii) ස්වභාවික විපත්වලට වන්දි ලබාගැනීමේදී;

ඇති වන ගැටලු සඳහා නිසි සාධාරණත්වයක් ඉටු කිරීමට ක්‍රමවේදයක් සැකසීමට බලාපොරොත්තු වන්නේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

423/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය ඉදිකිරීම පිළිබඳ වර්තමාන තත්ත්වය එතුමා මෙම සභාවට පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියේ මාර්ගය නිශ්චය කරගැනීම සඳහා මැනුම් තුනක් සිදුකර තිබෙන බවත්;

(ii) එහි තුන්වන මැනුමට අනුව, මෙම දුම්රිය මාර්ගය ඉදිකිරීමට තීරණය කර ඇති බවත්;

(iii) එම තුන්වන මැනුමට අනුව දඹුල්ල අතුපාරයාය ගම්මානය ආශ්‍රිතව ඉදිකිරීමට යෝජිත දුම්රිය ස්ථානය, පළමු මැනුමෙන් යෝජිත දුම්රිය ස්ථානය ඉදිකිරීමට නියමිතව තිබූ භූමියට වඩා නගරයට බෙහෙවින් දුරින් පිහිටා තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) තුන්වන මැනුමට අනුව අතුපාරයාය ගම්මානය ආශ්‍රිතව පිහිටුවීමට යෝජිත දුම්රිය ස්ථානය ඉදිකිරීමට නියමිත භූමිය ඉහළම ආර්ථික වටිනාකමකින් යුතු ඉඩමක්ද;

(ii) නොඑසේ නම්, වර්තමාන වෙළෙඳපල වටිනාකමට ගැලපෙන පරිදි වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර හා අවට ප්‍රදේශ කලක සිට නීතිවිරෝධී මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ මධ්‍යස්ථානයක්ව පවතින බවත්, පාසල් ශිෂ්‍යයන් හා තරුණ පිරිස් ඉලක්ක කර ගනිමින් සිදුකරන මෙම බෙදා හැරීමේ ජාලය තවමත් ශක්තිමත්ව ක්‍රියාත්මකවන බව එතුමා දන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ දෙක තුළ රත්නපුර දිස්ත්‍රික්කයේ —

(i) සිදු කරන ලද නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව;

(ii) මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වූ පුද්ගලයන් සංඛ්‍යාව;

(iii) අත්අඩංගුවට පත් වූ නීතිවිරෝධී මත්ද්‍රව්‍යවල වටිනාකම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට හඳුනාගෙන ඇති නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ගණයට අයත් මත්ද්‍රව්‍ය වර්ග හා ඒවා මෙරටට පැමිණෙන රටවල් ඇතුළත් නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) මෙම නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කඩිනමින් නීතියේ රැහැනට හසුකර, මත් උවදුර ප්‍රදේශයෙන් තුරන් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

62/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ ලාභ/අලාභ වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ යම් අලාභයක් ලැබුවේ නම්, ඒ සඳහා බලපෑ සාධක කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

104/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට පවතින විශ්වවිද්‍යාල විද්‍යායතන සංඛ්‍යාව;

(ii) එම ආයතන තුළ අධ්‍යයන කටයුතු කරන ශිෂ්‍ය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල විද්‍යායතන තුළ අධ්‍යයන කටයුතු කරන ශිෂ්‍යයන්ට ප්‍රමාණවත් දේශන ශාලා පහසුකම් නොමැති බවත්;

(ii) කථිකාචාර්යවරුන්ගේ හිඟයක් පවතින බවත්;

(iii) නේවාසිකාගාර පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම ගැටලු විසඳීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

165/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහුජාතික, බහුආගමික ජනතාවක් ජීවත් වන කොළොන්නාව ප්‍රදේශයේ තරුණ ප්‍රජාව හා පාසල් අධ්‍යාපනය ලබන දරුවන්, සංස්කෘතික, ආගමික හා සාරධර්මවලින් සපිරි පරපුරක් ලෙස සමාජයට දායාද කිරීමේ අරමුණින් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම අත්‍යවශ්‍ය හා යෝග්‍ය කරුණක් බවත්;

(ii) එම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පසුගිය කාලයේදී එවක උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අනුමතිය ලැබී තිබූ බවත්;

(iii) ඊට අදාළ ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම ද සිදු වූ බවත්;

(iv) නමුත්, එම ව්‍යාපෘතිය ඉන් ඉදිරියට ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

206/2020

ගරු චාල්ස් නිර්මලනාදන්,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය ජලය සපයන ප්‍රධාන ජලාශය කට්ටුක්කරෙ වැව බවත්;

(ii) මෙම වැව යටතේ පෝෂක වැව් 162ක් තිබෙන බවත්;

(iii) එම පෝෂක වැව්වලට ප්‍රධාන ඇළ මාර්ග 10ක් මගින් ජලය සැපයෙන බවත්;

(iv) දීර්ඝ කාලයක් එම ඇළ මාර්ග 10 ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා වැව්වලට සපයන ජලය අපතේ යන බවත්;

(v) මේ නිසා වැවේ ජලය කුඹුරුවලට ලබාගැනීමට නොහැකිවීමෙන් බෝග විනාශ වන බවත්;

(vi) ඉහත ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව මවිසින් පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීමෙන් අනතුරුව, ඇළ මාර්ග 5ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2019.06.06 දින රු.95,288,568.42ක් එවක පැවති රජය විසින් වෙන්කළ බවත්;

(vii) එම ඇළ මාර්ගවල වැඩ ආරම්භ කිරීමට නියමිතව තිබියදී නව රජයක් පත්වූ බැවින් වැඩ ආරම්භ නොකර නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, වගා කටයුතු නිසිපරිදි සිදු කිරීමට මග සලසනු ලබන මෙම ඇළ මාර්ගවල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

216/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ උඳු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම උඳු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම උඳු ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට උඳු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2020 ඔක්තෝබර් 09 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

187/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ, කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි/කිළිනොච්චිය මධ්‍ය මහා විද්‍යාලය නමැති පාසලක් පවතින බවත්;

(ii) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් දෙකෙන් එකක් වූ ඉහත විද්‍යාලයෙහි පහළ අධ්‍යාපන තත්ත්වයක්, ගුරු/සේවක පුරප්පාඩු, ගෘහභාණ්ඩ/ගොඩනැගිලි සහ සම්පත් හිඟකම් ඇතුළු අඩුපාඩු රාශියක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම පාසලට අවශ්‍ය ගොඩනැගිලි සහ ගෘහභාණ්ඩ ලබා දෙන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත විද්‍යාලයෙහි විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරු සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුරුවල විස්තර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත විද්‍යාලයෙහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතියද, මේ දක්වා එකී පුරප්පාඩු පිරවීම සඳහා පියවර නොගැනීමට හේතුව කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) උක්ත පුරප්පාඩු පිරවීමකින් තොරව සිසුන්ගේ අධ්‍යාපන කටයුතු දියුණු කළ නොහැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

254/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ග්‍රේට් වැලි වතුයාය, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) 2015 වනවිට අතහැර දැමූ හෝ වසා දමා ඇති කොටස් තිබේද;

(iv) එසේ නම්, එම කොටස්වල ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා කාලයේ දී මෙම වතුයායට අයත් ඉඩම්, කර්මාන්ත ශාලාව සහ වෙනත් ගොඩනැගිලි බාහිර පාර්ශ්වයට / පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් ලබා දී ඇති පවුල්, අයත්වන වතු සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඩම් නොමැති වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා ඉඩම් ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

190/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන්,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ඇති ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා ක්‍රිකට් සංගම් 25ක් තිබෙන බවත්;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා නොදීමට;

(ii) තම ලියාපදිංචිය ඉල්ලා කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය අවස්ථා ගණනාවකදීම අයදුම් කර ඇතත් මෙතෙක් ලියාපදිංචි නොකිරීමට;

හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයෙන් පසුව කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආධාර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

16/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව වැටුප් ලබන බවත්;

(ii) එකී PL කාණ්ඩයේ නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු, කොන්දොස්තර හා කාර්මික මට්ටමේ (PL කාණ්ඩයේ) නිලධාරීන් සංඛ්‍යාව සහ විධායක මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධාරීන්ට එම උසස්වීම් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම උසස්වීම් ලබා දෙන ශ්‍රේණි කවරේද;

(iv) එම උසස්වීම් ලබා දෙන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුවද;

(v) නොඑසේ නම්, කවර ක්‍රමවේදයකට අනුවද;

(vi) දැනට සිටින විධායක නිලධාරීන්ට අමතරව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016ට අනුව ලබාදෙන උසස්වීම් මගින් එක් ඩිපෝවකට අලුතින් පත්වන විධායක මට්ටමේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

64/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මගින් සිදුකරනු ලැබූ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් සිදු කිරීම වෙනුවෙන් ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබූ පොලිස් නිලධාරින්ගේ නම් කවරේද;

(iii) ඒ වෙනුවෙන් එම එක් එක් පොලිස් නිලධාරියාට ලබා දෙන ලද ත්‍යාග මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත වැටලීම්වලදී අත්අඩංගුවට ගත් එම මත්ද්‍රව්‍ය, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට පත් කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් කවරේද;

(vi) එම පොලිස් නිලධාරින්ට එරෙහිව පැවැත්වෙන විමර්ශනවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

106/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රා කර්මාන්තය ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) එම කර්මාන්තය ජීවනෝපාය කරගත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2019/12/31 දිනට ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී රා නිෂ්පාදනය කරන පුද්ගලයන්/ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිෂ්පාදනාගාරයට අදාළ අනුමත ධාරිතාවයන් ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම ධාරිතාවයන් එක් එක් ආයතනයට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රා කර්මාන්තයේ නියුක්තවන්නන්ගේ සුභසාධනය වෙනුවෙන් රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

167/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ සිදු කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

207/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති SLIATE ආයතනයේ Higher National Diploma පාඨමාලා ආරම්භ කර අවුරුදු 03ක් ගත වී තිබුණද තවමත් තාවකාලික ගොඩනැගිල්ලක එම ආයතනය පවත්වාගෙන යන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ හේතුවෙන් Information Technology, English, Tourism වැනි පාඨමාලා පමණක් පවත්වන බවත්;

(ii) පාඨමාලා සඳහා අවශ්‍ය පරීක්ෂණාගාර පහසුකම් නොමැති බව; සහ

(iii) Accounting, Management යනාදී පාඨමාලා ආරම්භ කිරීමට නොහැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) SLIATE ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උයිලංකුලම් ප්‍රදේශයේ අක්කර 05ක ඉඩමක් එවක උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දී වසරකටත් වඩා ගත වී ඇති බවත් එතුමා දන්නෙහිද?

(ඈ) මන්නාරමේ ඉදිකිරීමට නියමිත SLIATE ආයතනයේ ස්ථිර ගොඩනැගිල්ල ලෝක බැංකුවේ දායකත්වයෙන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක්ම පැවැත්වුණු අතර ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ වන්නේ කවදාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

218/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කව්පි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කව්පි ආනයනය කළ රටවල්වල නම් කවරේද;

(iv) එම කව්පි ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කව්පි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?